ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2027/8 – 2017 ජූලි 11 වැනි අඟහරුවාදා – 2017.07.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, මදුරාවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කනන්විල ගමේ පිහිටි, මැනුම්පති විසින් පිළියෙල කරන ලද අංක කේජ්/එම්ඩීආර්/2014/564 හා 2015.10.26 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්.5.1800 ක් වන පහත දක්වා ඇති ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක 1 – නාගහකන්ද වත්ත – ප්‍රමාණය: හෙක්. 5.1800**

උතුරට: ඇළ, ඉඩමේ නම් සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි කුඹුර, ඩී. වයි. එදිරිමාන්න හිමිකම් කියන වනාතෙ වත්ත සහ හොරණ වැවිලි සමාගම හිමිකම් කියන නාගහකන්ද වත්ත; නැගෙනහිරට: ඩී. වයි. එදිරිමාන්න හිමිකම් කියන වනාතේ වත්ත සහ හොරණ වැවිලි සමාගම හිමිකම් කියන නාගහකන්ද වත්ත, හත්ලහකන්ද රජමහා විහාරය හිමිකම් කියන පංසල් වත්ත සහ කරුණාරත්න ජයවීර හිමිකම් කියන රත්නගොඩ වත්ත; දකුණට: කේ. ඇසිලින්නෝනා හිමිකම් කියන පිටරුකත්තෙ වත්ත සහ ඇළ; බටහිරට: ඇළ.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/15/2014/වීඊ/63.
2017 පෙබරවාරි මස 13 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

07 – 799